

# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 276 කින් යුත් ශාඛා ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ දක්ෂ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර කළමණාකාර - නීති

**රැකියා ස්ථානය :** නීති අංශය – ඌව පළාත් කාර්යාලය

### ප්‍රධාන වගකීම්

- ණය උකස්කර ඔප්පු ලියා සහතික කිරීම සහ බැංකුව වෙනුවෙන් අනෙකුත් නෛතික ලේඛන සකස් කිරීම සහ සහතික කිරීම.
- නෛතික කාරණා සහ අධිකරණයේ නඩු සම්බන්ධයෙන් බැංකුවේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීම.
- කළමණාකාරීත්වය විසින් යොමු කරනු ලබන කාරණා වලට අදාළව ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් සහ මණ්ඩලයේ නීතිඥවරුන් (Panel Lawyers) සමග උපදේශන සාකච්ඡා පැවැත්වීම.
- පැමිණිලි, දිවුරුම් ප්‍රකාශ සහ පෙත්සම් කෙටුම්පත් කිරීම, අදාළ අධිකරණවල නඩු පැවරීම සහ නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- අනෙකුත් සියලුම නෛතික කටයුතු

### මූලික සුදුසුකම්

- නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ධූරය දැරීම. නීතිවේදී උපාධියක් සහිතවීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

  (ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම හෝ බැංකු/මූල්‍ය අංශයේ වෘත්තීය විභාග වලින් සමත් වීම අමතර සුදුසුකමක් වේ.)

  සහ

  නීතිඥ සහ නොතාරිස් කටයුතුවල අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද හෝ රජයේ හෝ පුද්ගලික ආයතනයක / නීති ආයතනයක නීති කටයුතුවල වසර 2ක අවම පළපුරුද්ද ලබා තිබිය යුතුය. බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වේ.
- තෝරාගත් අයදුම්කරුවන් සතුව අදාළ අධිකරණ කලාපය තුළ භාෂා දෙකෙන්ම (සිංහල සහ ඉංග්‍රීසි) කටයුතු කිරීමේ හැකියාව සහිත නොතාරිස් බලපත්‍ර ලබා තිබිය යුතුවේ.
- පරිගණක දැනුම තිබිය යුතුවේ.
- වයස : අවුරුදු 40 ට අඩු විය යුතුයි.
- මූලිකව වසර 02 ක කොන්ත්‍රාත් කාලයකට යටත්ව පත් කිරීම සිදු කරනු ලැබේ.

## තාක්ෂණික නිලධාරී - සිවිල්

**රැකියා ස්ථානය :** ප්‍රධාන කාර්යාලය

### ප්‍රධාන වගකීම්

- නව ඉදිකිරීම්, පවතින ගොඩනැගිලි නවීකරණය, ගොඩනැගිලි අභ්‍යන්තර කටයුතු සහ භූමි අලංකරණය සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම, ඉංජිනේරු ඇදීම්, ඉංජිනේරු ඇස්තමේන්තු, ප්‍රමාණ බිල්පත් (BOQ) සකස් කිරීම සහ ලංසු ලේඛන සකස් කිරීම ඇතුළුව සිවිල් ඉංජිනේරු ආශ්‍රිත සියලුම කාර්යයන් සිදු කිරීම.
- තාක්ෂණික ඇගයීම සිදු කිරීම සහ ටෙන්ඩර් අනුමැතිය සඳහා නිර්දේශ ලබා දීම.
- ඉදිකිරීම් අධීක්ෂණය, ප්‍රගතිය නිරීක්ෂණය සහ සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා ගෙවීම් සහතික කිරීම.
- ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධ වෙනත් කටයුතු සිදු කිරීම.
- මෙම තනතුරට අදාළව දිවයින පුරා පිහිටි ශාඛා/ වැඩබිම් විසිත්ත කිරීම.

### මූලික සුදුසුකම්

- ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) හෝ ඒ හා සමාන සුදුසුකම් (HNDE (Civil)/ NDES (Civil)) සහිතව අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද හෝ

  ජාතික තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව (NCT -Civil Enginering) සමග අවම වශයෙන් වසර 10ක පශ්චාත් පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ගොඩනැගිලි ඉදිකිරීම, නවීන නිමාව සහිත අභ්‍යන්තර සැකසුම් සකස් කිරීමේ පළපුරුද්ද ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
- ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතුය / ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු ඩිප්ලෝමාධාරියෙකු (Eng.Dip) ලෙස ලියාපදිංචි විය යුතුය.
- කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ AutoCAD භාවිතය අත්‍යවශ්‍ය වේ.
- ටෙන්ඩර් ලේඛන සකස් කිරීම, වාස්තු විද්‍යාත්මක සැලසුම්කරණය සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පළපුරුද්ද අත්‍යවශ්‍ය වේ.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ CIDA/SBD01/02/03/04 කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීම පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
- වයස අවු. 50ට අඩු විය යුතුය.
- මූලිකව වසර 02 කොන්ත්‍රාත් කාලයකට යටත්ව පත් කිරීම සිදු කරනු ලැබේ.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය

අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව අයදුම්කරුවන් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

### වැටුප්

තෝරාගන්නා ලද අයදුම්කරුවන්ට ආකර්ෂණීය වැටුප් පරිමාවක් පිළිබඳව සාකච්ඡා කර තීරණයකට එළඹීමට යෝජනා කළ හැක.

### අයදුම් කිරීම සඳහා අවසන් දිනය

2022 ජනවාරි 07

### අයදුම් කළ යුතු ආකාරය

මෙම තනතුරු සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික/වෘත්තීමය සහතිකපත්වල සහතික කරන ලද පිටපත් සහිතව ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පතෙහි නම, ලිපිනය, දුරකථන අංකය සහිතව ඥාතීන් නොවන වෘත්තීමය පුද්ගලයන් දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත් කර එවිය යුතු අතර, තැපැලෙන් යොමු කරන්නේ නම් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නැතහොත් එම අයදුම්පත් careers@rdb.lk විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
0112 42 52 62 | www.rdb.lk